# ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව

## නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

# පුරප්පාඩු

ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව වනාහි මෙරට තුළ, රාජ්‍ය අංශයේ විද්‍යාඥයන්ට මූල්‍ය සහාය ලබාදෙන, රජය විසින් අරමුදල් ප්‍රතිපාදන නියෝජ්‍යායතනයකි.

ජාතික පර්යේෂණ සභාවේ (NRC) හි පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකාවේ පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## ප්‍රධාන විධායක නිලධාරී - HM 2-1 තනතුර

**රැකියා විස්තරය :**

ජාතික පර්යේෂණ සභාවේ, (NRC) හි, සියලුම ක්‍රියාකාරිත්වයන් සහ පරිපාලන හා මූල්‍ය කටයුතු පිළිබඳ වගකීම් භාරය දැරීම සහ වග උත්තර දීම සිදුකළ යුතුය. තවද සභාවේ පොදු විධානය, මග පෙන්වීම හා පාලනය යටතේ, ජාතික පර්යේෂණ සභාවේ තිල සාර්ථකත්වයන්, සාක්ෂාත් කර ගැනීම සහ අරමුණු හඹායාමේදී හා එහි කාර්ය කටයුතුවලදී විශිෂ්ටත්වය අත්කරගැනීමට සහ සභාවේ කාර්ය මණ්ඩලයට දයකත්වය සැපයීම හා දිරිමත් කිරීම සඳහා සහ සභාව නියෝජනය කළ හැකි වන පරිදි සභාවේ පැවරෙන බලතල පාවිච්චි කිරීම යෙදවීම හා ක්‍රියාකාරකම් සහ රාජකාරී හා යුතුකම්, වගකීම් ඉටුකිරීම රැකියාවේ වගකීම් හා කාර්ය භාරයට අන්තර්ගත වනු ඇත.

**සුදුසුකම් :**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමෂන් සභාව විසින් පිළිගනු ලබන විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක් සහ විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක, පිළිගත් කළමනාකරණය පිළිබඳ වෘත්තියවේදී ආයතනයක ආයතනික සාමාජිකත්වය

   **සහ**

   ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක, සනාථ කළ සේවා වාර්තාවක් සහිතව කළමනාකරණ මට්ටමේ, අඩුම තරමින් වසර 20 ක පළපුරුද්ද සහ ඉන් වසර 05 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

   **හෝ**

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක් සහ විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනයට හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක දර්ශනශූරී / ආචාර්ය (Ph.D.) උපාධියක්.

   **සහ**

   ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු, රාජ්‍ය සංස්ථාවක ව්‍යවස්ථාපිත මණ්ඩලයක, හෝ පිළිගත් වෙළඳ ආයතනයක අඩුම තරමින් වසර 05 ක සනාථ කළ සේවා වාර්තාවක් සහිත ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ කළමනාකරණ පළපුරුද්ද.

**වයස :** අවුරුදු 35 ට නොඅඩු සහ 55 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** HM 2-1 - (රු. 91,645-2,700X12-124,045)

**ඉහත තනතුර සඳහා අදාළ වන වෙනත් කොන්දේසි :**

1. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
2. අයදුම්කරුවන්, දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට හා තනතුරට පැවරෙන රාජකාරී මැනවින් ඉටුකිරීමට හැකිවන සේ, කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත වූවන් විය යුතුය.
3. අයදුම්කරුවන් විශිෂ්ට හා අනර්ඝ චරිතයකින් යුක්ත වූවන් විය යුතුය.
4. බඳවා ගැනීම, පත්කිරීමේ බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් විසින් මෙහෙයවනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදු කරනු ලැබේ.
5. මෙම පත්වීම, ස්ථිර පත්වීමක් වන අතර, සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට (ETF) හිමිකම් සහතිකය. 2016 අංක 11 දරන ජාතික පර්යේෂණ සභා පනත ප්‍රකාර මෙම පත්වීම, පත්වීම්ලාභියාගේ පත්වීම ලද දින සිට ගණනය කරනු ලබන පස් (05) අවුරුදු කාලසීමාවක් දක්වා වනු ඇත. ප්‍රධාන විධායක නිලධාරියා (CEO), නැවත පත්කරනු ලැබුවහොත් හැර, ඔහු / ඇය ප්‍රධාන විධායක නිලධාරී (CEO) ලෙස පත්වීම ලද දිනට පෙර දින සිට එකී පනත විසින් පාලනය වන ආයතනයක කාර්ය මාණ්ඩලිකයෙකුව සිට ඇත්නම් ඔහු / ඇය සිය හැටවන (60 වන) වසර සම්පූර්ණ කර නොමැති වන්නේ නම්, ඔහුට / ඇයට හිමි ස්ථාවර / ස්ථිර තනතුරට (ආයතනය තුළ) ඔහු / ඇය ප්‍රත්‍යාවර්තනය කරනු ලබනු ඇත.
6. ජාතික පර්යේෂණ සභාවේ නියමිත අදාළ තනතුරට හිමි ආත්කෘත ප්‍රතිලාභ (වාහනයක් හෝ වාහන දීමනාව, ඉන්ධන දීමනාව හා සන්නිවේදන දීමනාව) හිමි වනු ඇත.
7. අයදුම්කරුවන් විසින් සිය අත්සන යෙදූ, අයදුම්පත් සිය උප්පැන්න සහතිකය හා වෙනත් අදාළ සහතිකපත්වල පිටපත්ද සමග ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනද සහිතව, අයදුම්කරනු ලබන තනතුර, කවරයේ වම්පස ඉහළ කෙළවරේ සටහන් කරමින්, 2021 ජූලි මස 27 වන දිනට හෝ ඊට පෙර, ලැබෙන සේ කොළඹ 07, විද්‍යා මාවතේ, අංක 120/7 ජාතික පර්යේෂණ සභාවේ සභාපති වෙත ලියාපිදංචි තැපෑලෙන් / කුරියර් සේවාව මගින් ඉදිරිපත් කළ යුතුය.
8. අයදුම්කරු විසින් සිය ජීවදත්ත තොරතුරු ප්‍රකාශ (CV) හි ස්කෑන්කළ, (පරිලෝකනගත) පිටපතක් සමග, උප්පැන්න සහතිකය හා වෙනත් අදාළ සහතිකවල admin@nrc.gov.lk යන විද්‍යුත් ලිපිනයට පිටපත්ද සමග Scan කර "COVID" අදාළ තැපැල් / කුරියර් සේවා ප්‍රමාදයන් මග හැරවීම සඳහා) කලට වේලාවට යොමුකළ හැකිවන පරිදි ඉදිරිපත් කළ යුතුය. CV හි සියලු පිටු, අපේක්ෂකයාගේ අත්සන යොදා සහතික කළ යුතුය.
9. රජයේ දෙපාර්තමේන්තු / රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු නිලදරීන් / අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ ආයතනවල ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතුය.
10. ඉහත සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූලව නොමැති සියලුම අයදුම්පත් භාර ගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.
11. තනතුරට උචිත හා යෝග්‍ය අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

මෙම දැන්වීම ජාතික පර්යේෂණ සභාවේ (NRC) හි, වෙබ් අඩවිය වන www.nrc.gov.lk හි ප්‍රකාශයට පත්කර ඇත.

**සභාපති,**
**ජාතික පර්යේෂණ සභාව,**
**120/7, විද්‍යා මාවත, කොළඹ 07.**
**දුරකථන : 011-2675176, ෆැක්ස් : 011-2675136, ඊමේල් :** admin@nrc.gov.lk